කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011

2012 දෙසැම්බර් / 2013 ජනවාරි

සමාජීය විද්‍යා පීඨය

මානව විද්‍යාව - ANTH - E 2015

ශ්‍රී ලංකාවේ වැදි ජන උරුමය

<u>ප්‍රශ්න අටෙන් හතරකට (04) පිළිතුරු ලියන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. 1950 දශකයට පෙර ශ්‍රී ලංකාවේ වැදි ජනයා පිළිබඳ සිදුකෙරී ඇති පර්යේෂණ පිළිබඳ සමාලෝචනයක් කරන්න.

02. වැදි ජනතාව සම්ප්‍රදායික උරුම බිමෙන් විතැන් කිරීම, ඔවුන්ගේ සංස්කෘතික උරුමය ගිලිහී යෑමට බලපා ඇති ආකාරය විස්තර කරන්න.

03. වැදි ජනතාවගේ සංස්කෘතියේ විවාහය; පවුල් ජීවිතය, ඥාති සම්බන්ධතා පැවැත්වීම වැනි සමාජ චර්යා පද්ධති ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න.

04. මානව විද්‍යා පර්යේෂකයකුගේ පෞද්ගලික දෘෂ්ටිකෝණය වැදිජනයා අධ්‍යයනය කිරීමට කොතෙක්දුරට උපයෝගී වේදැයි විමසන්න.

05. ශ්‍රී ලංකාවේ වැදි ජනතාවගේ ඇති කලාපීය වෙනස්කම් පිළිබඳ ප්‍රාමාණික හැඳින්වීමක් කරන්න.

06. ප්‍රාථමික ගෝත්‍රයක් වශයෙන් වැදි ජනතාව තුළින් කොතරම් දුරට ගෝත්‍රික ලක්ෂණ පිළිබිඹු වන්නේදැයි විමර්ශනයක යෙදෙන්න.

07. වැදි සමාජයේ වෙනස්වීම් අතර වර්තමානය වන විට රූප විද්‍යාත්මක, ජාන විද්‍යාත්මක යන භෞතික වෙනස්කම් ද පවතින බව උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

08. වැදි ජනතාව නූතන සමාජය තුළ සමාජගතවීමේදී මුහුණ දෙන ප්‍රායෝගික ගැටළු මොනවාදැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

පැවරුම් මාතෘකාව

වැදි ජනතාවගේ භාෂාමය හා වාග්විද්‍යාත්මක වෙනස්වීම් සිදු වී ඇති ආකාරය පිළිබඳ පර්යේෂණයක් කරන්න. (සැ.යු. පරීක්ෂණයෙන් මසක් ඇතුලත බාරදිය යුතුය.)

*******************************